[Limited Sharing]

**ශ්‍රී ලංකාව පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මාධ්‍ය හමුව**

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ආසියා සහ ශාන්තිකර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ක්‍රිෂ්ණා සිරිනිවාසන්ගේ ආරම්භක ප්‍රකාශය**

2023, මැයි 15

කොළඹ, ශ්‍රී ලංකාව

*(බෙදා හැරීම සඳහා සූදානම් කළ පරිදි)*

සුබ සන්ධ්‍යාවක්. මෙම මාධ්‍ය හමුව සමඟ සම්බන්ධ වීම පිළිබඳව මා ස්තුතිවන්ත වනවා. ඔබ සැම දෙනාම මෙලෙස දක්නට ලැබීම සතුටක්.

මා දැන් සිටින්නේ කොළඹ - මේ ශ්‍රී ලංකාව වෙත මා සිදු කළ ප්‍රථම සංචාරයයි. මෙරටෙහි පුළුල් පරාසයක සිටින පාර්ශ්වයන් සමඟ ජාත්‍යන්තර මූල්‍ය (ජා.මූ.) අරමුදලෙහි සම්බන්ධය තවදුරටත් ශක්තිමත් කිරීම එහි අරමුණයි. ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමන් සහ එරටෙහි ඉහළ පෙළෙහි නායකයන් හමුවීමට අමතරව, විරුද්ධ පක්ෂයේ සාමාජිකයන්, සිවිල් සමාජ සංවිධාන, වෘත්තීය සමිති, බුද්ධි මණ්ඩල සහ අනෙකුත් ඇල්මැති පාර්ශ්වයන් සමඟ සම්බන්ධ වීමට මා හට හැකි වී තිබේ. පීටර් බ්‍රවර් විසින් මෙහෙයවනු ලබන ජා.මූ.අරමුදලෙහි කාර්ය මණ්ඩල කණ්ඩායමක් ද මේ වන විට ශ්‍රී ලංකාවට පැමිණ සිටින අතර, මෙම වසරේ ඉදිරි කාලයේ දී පැවැත්වීමට නියමිත ප්‍රථම සමාලෝචන මෙහෙයුමෙහි නිත්‍ය සාකච්ඡා පැවැත්වීම සඳහා ඔවුන් මැයි 23 වන දින තෙක් මෙරටෙහි රැඳී සිටිනු ඇත. එම කණ්ඩායම මෙම සංචාරය අවසානයේ දී ඔබ සමඟ තවදුරටත් සන්නිවේදනයේ යෙදෙනු ඇත.

මම ශ්‍රී ලංකාව සම්බන්ධව කතා කිරීමට පෙර, මෙම කරුණු කාරණා පිළිබඳව පැහැදිලි දසුනක් ඔබ වෙත ළඟා කිරීම සඳහා **ගෝලීය සහ කලාපීය ඉදිරි දැක්ම** පිළිබඳ අදහස් කිහිපයක් ගෙන හැර දැක්වීමට කැමැත්තෙමි.

**2023 වසර ගෝලීය ආර්ථිකය සඳහා අභියෝගාත්මක වසරක් ලෙස පෙනෙයි.** පොලී අනුපාතික ඉහළ යෑම සහ යුක්‍රේනයෙහි රුසියානු යුද්ධය මගින් එල්ල වන දැඩි බලපෑම් හේතුවෙන්, ගෝලීය වර්ධනය මන්දගාමී වී, 2023 වසරේ දී එහි අවමය කරා ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය උද්ධමනය ක්‍රමයෙන් ලිහිල් වෙමින් පවතින නමුත්, බෙහෙවින් ඉහළ අගයක පවතියි. තවද, ඇමෙරිකා එක්සත් ජනපදයේ සහ යුරෝපයේ බැංකු ආයතන දුර්වල වීම් දැනටමත් පවතින මෙම සංකීර්ණ පසුබිමට ඉමහත් අවිනිශ්චිතතාවක් එක් කර ඇත.

තිරය පිටුපස පවතින මෙම ගෝලීය අවිනිශ්චිතතාවට එරෙහිව, ආසියානු ශාන්තිකරය ක්‍රියාශීලී කලාපයක් ලෙස රැඳී පවතී. ලොව පුරා දැවැන්ත ආර්ථිකයන් තුළ විදේශීය ඉල්ලුම දුර්වල වීම සහ මුදල් දැඩි කිරීම සිදු කළ ද, දේශීය ඉල්ලුම මෙතෙක් දුරට ශක්තිමත්ව පැවතිණි. ආසියානු සහ ශාන්තිකර කලාපයන්හි වර්ධනය 2022 වසරේ දී වාර්තා වූ සියයට 3.8 සිට මෙම වසරේ දී සියයට 4.6ක් දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම කලාපය විසින් ගෝලීය වර්ධනයට සියයට 70කින් පමණ දායක වනු ඇත. චීනය යළි යථා තත්ත්වයට පත් වීම සහ ඉන්දියාවේ ස්ථාවර වර්ධනය මගින් ආසියාවේ ගතිකත්වය මූලික වශයෙන් මෙහෙයවනු ඇති අතර,

ආසියාවේ සෙසු රටවල වර්ධනය අනෙකුත් කලාපවලට අනුකූලව, 2023 වසරේ දී තවදුරටත් පහළ යනු ඇතැයි අපේක්ෂිත ය.

**කෙසේ වෙතත්, මෙම ගතික ඉදිරි දැක්මෙන් මෙම කලාපයේ ප්‍රතිපත්ති සම්පාදයකයින්ට තවදුරටත් තෘප්තිමත් වීමට ඉඩ සැලසෙනු ඇතැයි  අදහස් නොකෙරේ.** මතුපිට උද්ධමනය ලිහිල් වෙමින් පැවතියත්, බොහෝ රටවල් තුළ ඉලක්කගත මට්ටමට වඩා ඉහළින් පවතින අතර, මූලික උද්ධමනය තවමත් එම අගයන්හි ම පවතී. යුරෝපීය සහ ඇමෙරිකා එක්සත් ජනපද බැංකු අංශයන්හි හටගත් අර්බුදවල අහිතකර ප්‍රතිඵල මෙතෙක් දුරට සීමා වී තිබුණ ද, විශේෂයෙන් ම ආයතනික සහ කුටුම්භ අංශවල ගෝලීය මූල්‍ය දැඩි කිරීමට සහ නිතර මිල උච්චාවචනය වන වෙළෙඳපොළ තත්ත්වයන් කරා ඇති වන අවදානම්සහගත බව ඉහළ ගොස් තිබේ. වයස්ගත ජනගහණය, ඵලදායීතාව පහළ යෑම සහ වසංගත බිය ඇතුළුව, සාධක ගණනාවක් පිළිබිඹු කරමින්, මෙම කලාපයේ වර්ධනය මෑත ඉතිහාසයේ අවම මැදි කාලීන පුරෝකථනය වන, වසර පහක් තුළ දී සියයට 3.9ක් දක්වා පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ගෝලීය සහ කලාපීය මිල පීඩන තවදුරටත් එලෙස ම පැවතීමට තිබෙන හැකියාව, දියුණු ආර්ථිකයන්හි මුදල් ප්‍රතිපත්ති මාර්ගය සම්බන්ධව වෙළෙඳපොළ අදහස් සහ ඒවායෙහි මහ බැංකු විසින් නිවේදනය කරනු ලබන දෑ අතර සම්බන්ධයක් නොමැති වීම, ගෝලීය මූල්‍ය වෙළෙඳපොළ තුළ අතිරේක අර්බුද හට ගැනීමේ හැකියාව, චීනයේ මැදි කාලීන වර්ධනය මන්දගාමී වීමෙන් කලාපය වෙත අහිතකර බලපෑම් ඇති වීම සහ ගැඹුරු භූ ආර්ථික ඛණ්ඩනය හේතුවෙන් **ඉදිරිදැක්ම කෙරෙහි පවතින අවදානම් අවාසිසහගත වේ.**

**මෙම අභියෝගාත්මක ගෝලීය පරිසරය ශ්‍රී ලංකාව සඳහා අඟවන්නේ කුමක්ද?**

ඔබ දන්නා පරිදි, ශ්‍රී ලංකාව **අතීතයේ ගත් වැරදි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ එකක් පසුපස එකක් වශයෙන් පැමිණි ආර්ථික කම්පන හේතුවෙන් දැඩි අර්බුදයකට මුහුණ දෙමින් සිටියි.** අර්බුදය විසින් ශ්‍රී ලාංකික ජනතාව මත, විශේෂයෙන් ම දිළිඳු සහ අවදානමට ලක් විය හැකි කාණ්ඩ මත එල්ල කරන ලද බලපෑම පිළිබඳව මෙන්ම, විදේශීය මූල්‍යනය වෙත රටේ ප්‍රවේශය ප්‍රමාද කිරීමෙහි ආර්ථික පිරිවැයන් පිළිබඳව ද අපි ගැඹුරින් සලකා බලන්නෙමු.

ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණ සඳහා සහාය ලබා දීමට **ජා.මූ. අරමුදලෙහි විධායක මණ්ඩලය විසින් මාර්තු 20 වන දින එ.ජ. ඩොලර් බිලියන 3ක පමණ වන, මාස 48ක විස්තීර්ණ ණය පහසුකමක් අනුමත කරන ලදී.** මෙය අර්බුදය නිරාකරණය කිරීම කරා වැදගත් පියවරක් සනිටුහන් කළේය. ආසියානු සංවර්ධන බැංකුවෙන් සහ ලෝක බැංකුවෙන් ඇතුළුව නව විදේශීය මූල්‍ය පොළඹවනු ඇතැයි අපේක්ෂා කෙරෙන, ඩොලර් මිලියන 330ක පමණ මූලික ගෙවීමක් මෙම විස්තීර්ණ ණය පහසුකමෙන් ශ්‍රී ලංකාව වෙත වහාම හිමි විය. දුර්වල විදේශීය පරිසරය සහ සාර්ව ආර්ථික ස්ථායීභාවය යළි ප්‍රතිස්ථාපනය කිරීම අරමුණු කරගත් දේශීය ප්‍රතිපත්ති දැඩි කිරීම සලකා බැලීමේ දී, මෙම ආර්ථිකය 2024 වසරේ දී සියයට 1.5ක සාමාන්‍ය වර්ධනයක් වාර්තා කිරීමට පෙර, 2023 වසරේ දී සියයට 3කින් සංකෝචනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම අපේක්ෂාවන් ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම මත බෙහෙවින් තීරණාත්මක ලෙස රඳා පවතී.

**ඔබ දැන් හොඳින් දන්නා පරිදි, විස්තීරණ අරමුදල් පහසුකම යටතේ සහාය ලද මෙම ප්‍රතිසංස්කරණ වැඩසටහන ශක්තිමත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මත ගොඩනඟා ඇති අතර, ප්‍රධාන ආධාරකයන් පහක් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙයි.**

**ප්‍රථමයෙන්,** රජයට එහි සියලු අත්‍යවශ්‍ය වියදම් සඳහා සහාය ලබා දීමට තිබෙන හැකියාව තහවුරු කිරීම සඳහා ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාල, රාජ්‍ය මූල්‍ය ආයතනික ප්‍රතිසංස්කරණ සහ පිරිවැය ආපසු අය කර ගැනීම පදනම් කරගත් බලශක්ති මිලකරණයෙන් සමන්විත, **අපේක්ෂා සහිත ආදායම් පදනම් කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව.**

**දෙවනුව,** ණය ප්‍රතිව්‍යුහගතකරණයක් ඔස්සේ රජයේ මෙහෙයුම් කටයුතුවල ස්ථාවර මූල්‍යනයක් තහවුරු කිරීම ඇතුළුව, **රාජ්‍ය ණය තිරසරබව යළි පිහිටුවීම.**

තෙවනුව, උද්ධමනයෙන් විශේෂයෙන් දිළිඳු ප්‍රජාව මත එල්ල වන පීඩාව සමනය කිරීම සඳහා, ආයෝජන සහ වර්ධන පරිසරයක් වර්ධනය කිරීමට සහ විදේශයෙන් අත්‍යවශ්‍ය භාණ්ඩ මිල දී ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ හැකියාව තහවුරු කිරීමට වඩා නම්‍යශීලී විනිමය අනුපාතිකයක් යටතේ **මිල ස්ථායීතාව යළි පිහිටු වීමට සහ සංචිත යළි ගොඩනැඟීමට බහු පාර්ශ්වික උපාය මාර්ගයක් යෙදීම.**

සිව්වනුව, මූල්‍ය අංශයට ආර්ථික වර්ධනය සඳහා සහාය දැක්වීමේ දී එහි ප්‍රධාන කාර්යභාරය ඉටු කළ හැකි බව තහවුරු කිරීමට, **මූල්‍ය අංශ ස්ථායීතාව ආරක්ෂා කිරීම සඳහා වන ප්‍රතිපත්ති.**

**එමෙන්ම පස්වනුව, දූෂණ අවදානම් සඳහා පිළියම් යෙදීමට සහ වර්ධනය ඉහළ නැංවීමට ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීම.** ශ්‍රී ලාංකික ප්‍රජාව ප්‍රතිසංස්කරණවලින් අසීරුවෙන් ලබා ගන්නා ජයග්‍රහණවලින් ප්‍රතිලාභ ලබන බව තහවුරු කිරීමට දූෂණය පිටු දැකීම සහ පාලන ප්‍රතිසංස්කරණ අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකාව ජා.මූ. අරමුදලේ පාලන විනිශ්චය කිරීමේ ප්‍රයත්නයට මුහුණ දී ඇති ආසියාවේ ප්‍රථම දේශය යි. ජා.මූ. අරමුදලේ පාලන විනිශ්චය කිරීමේ වාර්තාව මෙම වසරේ සැප්තැම්බර් මාසය වන විට ප්‍රකාශයට පත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම දූත මණ්ඩලය මාර්තු මාසයේ දී කොළඹ වෙත සංචාරය කළ අතර, මෙම තීරණාත්මක ප්‍රතිසංස්කරණ අංශය පිළිබඳව ඇල්මැති පාර්ශ්වයන් සහ සිවිල් සමාජ සංවිධාන සමඟ සමීපව සාකච්ඡා පැවැත්වූහ. අපි තවදුරටත් ඔවුන් සමඟ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන්නෙමු.

ප්‍රශංසනීය ලෙස, ශ්‍රී ලංකාව මෙම අංශ පහ තුළ අභියෝගාත්මක ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගණනාවක් ක්‍රියාත්මක කිරීම දැනටමත් ආරම්භ කර ඇත. **බලධාරීන් සහ ශ්‍රී ලාංකික ජනතාව විසින් වඩාත් පුළුල් වශයෙන් ශක්තිමත් හිමිකාරීත්වයක් යටතේ මෙම ප්‍රතිසංස්කරණ සිදු කර ගෙන යෑමේ වේගය අඛණ්ඩව පවත්වා ගෙන යෑම දැන් අත්‍යවශ්‍ය කරුණකි.**

**දිළිඳු සහ අවදානමට ලක් විය හැකි ප්‍රජාවගේ අවශ්‍යතාවන් මත සිදු කරන ප්‍රතිසංස්කරණවල ආර්ථික බලපෑම නිසි ක්‍රියාමාර්ග සහිතව අවම කළ යුතු වේ.** මේ සම්බන්ධව, අවම ගෙවීම් තලයක්, නව සමාජ ලියාපදිංචි කිරීමේ කාර්යාලයක් ඔස්සේ මැනවින් ඉලක්ක කරන ලද ගෙවීමක් සහ අරමුණු යෝග්‍යතා නිර්ණායක පිහිටුවීම ඇතුළුව, සමාජ ආරක්ෂණ ජාල ශක්තිමත් කිරීම සඳහා දැඩි ලෙස කැප වන මෙන් අපි බලධාරීන් වෙත ඇරයුම් කරන්නෙමු.

**ජා.මූ. අරමුදල විසින් ලබා දෙන මෙම වැඩසටහන සියලු ශ්‍රී ලාංකිකයන්ට මෙම අර්බුදය ඔස්සේ එකට එක්ව කටයුතු කර, ආර්ථික ස්ථායීතාව යළි පිහිටුවීමට සහ දේශය තිරසරාත්මක වර්ධන මාවතක් කරා යොමු කරවීමට අවස්ථාවක් වන බව පවසමින් මගේ කතාව මම මෙලෙස නිම කරමි. වඩාත් වැදගත් වන්නේ ක්‍රියාත්මක කිරීම යි. ඔබ යන මගෙහි ඔබට රුකුළක් වීමට ජා.මූ. අරමුදල බලා සිටියි.**

මගේ කතාව මින් නිමා කරමි. ඔබගේ ගැටලුවලට පිළිතුරු ලබා දීමට ලැබීම සතුටක්. ස්තූතියි.